ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023-01-09 |

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | පී.ඒ. කාන්ති මල්ලිකා නිලවිර මිය,<br>මිරහවත්ත වත්ත, වැලිකඩගම පාර,<br>මීරගහවත්ත, වැලිමඩ. |
| වගඋත්තර පාර්ශවය | : | 01. කාන්තා බන්ධනාගාර නියාමක පී.වී.එස්.ආර්.පට්ටිවිදාන මිය,<br>ශ්‍රී ලංකා බන්ධනාගාරය,<br>බදුල්ල. |
| | | 02. කාන්තා බන්ධනාගාර නියාමක එම්.පී.ඩී.එස්.ජයලත් මිය,<br>ශ්‍රී ලංකා බන්ධනාගාරය,<br>බදුල්ල. |

<u>පැමිණිලි අංකය : **HRC/BD/163/15**</u>

ඉහත ලිපිනයෙහි පදිංචි පී.ඒ.කාන්ති මල්ලිකා නිලවිර යන අය විසින් 2015.08.11 දාතමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින්, තමා ව්‍යාපාරික ක්ෂේත්‍රයේ නියැලෙන වයස අවුරුදු 50 ක් වූ දෙදරු මවක් වන බවත්, තම ව්‍යාපාර කටයුතුවල නියුක්ත සේවකයෙකුට, සේවක අර්ථ සාධක අරමුදල නොගෙවීම සම්බන්ධයෙන් 2015.07.15 වන දින තමා වැලිමඩ දිසා අධිකරණයේ පෙනී සිට අදාළ ගෙවීම් කටයුතු සිදු කළ බවත්, එහිදී මහේස්ත්‍රාත්තුමා විසින් තමාට එරෙහිව බණ්ඩාරවෙල දිසා අධිකරණයෙන් විවෘත වරෙන්තුවක් නිකුත් කර ඇති බව දන්වා සිටින ලද බවත් සඳහන් කර ඇත.

තමා ඒ පිළිබඳව කිසිදු අයුරකින් දැනුවත්ව නොසිටි හෙයින් අදාළ මුදල ගෙවීමට සාධාරණ කාලයක්ද නොතිබූ නිසා ඒ පිළිබඳව විමසීමේදී එක් දිනයක් බන්ධනාගාර ගතව පසුදින එකී ගෙවීම බණ්ඩාරවෙල ගරු අධිකරණයට ගෙවිය හැකි බවට අධිකරණයෙන් උපදෙස් ලද බවත්, ඒ අනුව තමා එදින ප.ව.3.00ට පමණ බදුල්ල බන්ධනාගාරයට අයත් බස් රථයකින් බදුල්ල බන්ධනාගාරය වෙත රැගෙන ආ බවත්, ඒ අතරතුර එහි සිටි



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

කාන්තා රැඳවියන් කිහිප දෙනාහට කාන්තා නිලධාරිනිය විසින් නොයෙකුත් ආකාරයෙන් බැණ වැදීම් සිදුකළ බවත්, පස්වරු 06.00 පමණ වනවිට බස් රථය බදුල්ල බන්ධනාගාරයට පැමිණි අතර ඊට පසු බන්ධනාගාර බස් රථයේ පැමිණි නිලධාරිණිය තමාව වෙනත් කාන්තා නිලධාරිණියකට භාරදුන් බවත්, එම නිලධාරිනිය තමා සතුව වෙනත් කිසිවක් ඇද්දැයි විමසූ බවත්, තමා එදින නිවසෙන් පිටත් වන විට වැඩි ආරක්ෂාව සඳහා රු.250 ක පමණ මුදලක් තමාගේ තණපට තුළ දමාගෙන පැමිණි බව ඒ වන විට අමතකව තිබූ බවත්, එසේම කිසිදු දිනක බන්ධනාගාර ගතවීමක් සිදුවී නොමැති හෙයින් තමා කම්පනයට පත්ව සිටි බවත්, ඒ අනුව තමා සතුව කිසිවක් නොමැති බව පැවසූ බවත් සඳහන් කර ඇත. ඉන් පසු තමා බාර ගත් නිලධාරිණිය තමාගේ ඇඳුම් එකින් එක ඉවත් කළ අතර, එම අවස්ථාවේදී තමා රඳවා ගෙන සිටි රු.250 ක පමණ මුදල ඇයට හමු වූ බවත්, එතැන් සිට එම නිලධාරිනිය තමාට නිර්දය ලෙස බැණ වදිමින් පහර දෙන්නට පටන් ගත් බවත්, ඒ අසල සිටි තමාව බස් රථයෙන් රැගෙන ආ නිලධාරිනියට කතා කොට මේ බව පැවසූ බවත්, ඊට පසු ඇය විසින්ද තමාගේ කොණ්ඩයෙන් අල්ලාගෙන තමාගේ මුහුණට හා පපුවට දිගින් දිගටම පහර දෙන්නට පටන් ගත් බවත් දක්වා ඇත. එම නිලධාරිනිය ඇයගේ සපත්තු පැළඳි දෙපයින් තමාගේ කකුල් පෑගූ බවත්, ඉන් අනතුරුව ඔවුන් විසින් තමාව මුළුමනින්ම නිරුවත් කර ගොඩනැගිල්ල තුළ එහා මෙහා ඇවිදින්නට සැලැස්වූ බවත්, මෙසේ පැයකට පමණ ආසන්න කාලයක් බැණ වැදීම් හා පහර දීම් සිදු කර නිරුවත්ව තැබීමෙන් අනතුරුව තමාට ඇඳුම් ඇඳගන්නට දී දෙවැනි වරට තමාව භාරගත් නිලධාරිනිය වතුර ටැංකියක් අසලට තමාව කැඳවා තමා ඇඳ සිටි ඇඳුම වලට වතුර ඉසින ලද බවත්, පසුව තමාට බැන වදිමින් "තෝ මේ තෙත ඇඳුම්ම හෙට ඇඳගෙන පල තොට කරන දේ බලා ගනින්" ආදී වශයෙන් තර්ජනය කර එදින රාත්‍රියේ ඇදීම සඳහා ඉතාමත් කිලිටු දුර්ගන්ධ වැරහැලි රෙදි කිහිපයක් දුන් බවත්, අනෙකුත් කාන්තා රැඳෙවියන්ට නිදා ගැනීමට මෙට්ට ලබා දුන්නත් තමාට කිසිදු පහසුකමකින් තොරව මුළු රැයම බිම වාඩි වී සිටීමට සැලැස්වූ බවත් දක්වා ඇත.

පසුදා උදෑසන 06.00ට පමණ බදුල්ල බන්ධනාගාර බස් රථයෙන් පෙ.ව. 7.30 පමණ වන විට බණ්ඩාරවෙල අධිකරණයට රැගෙන ආ බවත්, එහිදි අධිකරණයට ගෙවිය යුතු මුදල ගෙවා නිදහස් වීමෙන් අනතුරුව ඥාතින් මුණගැසීමට අවස්ථාව සැලසුණු බවත්, එහිදි තමාගේ කායික හා මානසික අපහසුතා ඔවුන්ට දැනුම් දුන් පසු ඔවුන් විසින් තමාව බදුල්ල මහ රෝහලට ඇතුළත් කළ බවත්, එම රෝහලේ වාට්ටු දෙකකදි දින හයක කාලයක් නේවාසික ප්‍රතිකාර ලබා ගත් බවත් දක්වා ඇත. මෙම සිද්ධිය හේතුවෙන් තමන් විශාල කායික හා මානසික පසු බෑමකට ලක් වූ බවත්, තමාගේ ව්‍යාපාර කටයුතු අඩාල වූ බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත.

මේ සම්බන්ධව පරීක්ෂා කර බලා තමාට සිදු වූ අපහාස හා හිංසනයන් සිදුකළ බන්ධනාගාර නිලධාරිනියන් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

මීට අදාළව බදුල්ල බන්ධනාගාරයේ සහකාර බන්ධනාගාර අධිකාරී වෙතින් වාර්තා කැඳවා ඇති අතර, බදුල්ල බන්ධනාගාර අධිකාරිගේ වාර්තාව මඟින් අදාළ පැමිණිලි පාර්ශවය, සැකකාරියක් ලෙස බදුල්ල බන්ධනාගාරගත වූ ආකාරයත්, ඇයව භාරව බදුල්ල බන්ධනාගාරය වෙතින් පැමිණියේ බන්ධනාගාර කාන්තා නියාමක පී.වී.එස්.ආර්.පට්ටිවිදාන යන අය බවත්, පසුව අදාළ සැකකාරිය බන්ධනාගාරය තුළ භාර ගෙන ඇත්තේ බන්ධනාගාර කාන්තා නියාමක එම්.පී.ඩී.එස්.ජයලත් යන අය බවත්, සඳහන් කර ඇත.

මෙම සැකකාරිය බන්ධනාගාරයට භාර ගැනිමට පෙර, ඇයගෙන් විමසා බලා වටිනා භාණ්ඩ හෝ මුදල් නොමැති බව තහවුරු කර ගැනීමෙන් පසුව, බන්ධනාගාරය තුළට භාර ගත් බවත්, සාමාන්‍යයෙන් සැකකාරියන් පරීක්ෂා කරනු ලබන්නේ බන්ධනාගාරය තුළදී බවත්, ඒ අනුව සැකකාරියව කාන්තා නියාමක එම්.පී.ඩී.එස්.ජයලත් යන අය විසින් පරීක්ෂා කිරීමේදී සැකකාරියගේ උඩුකය යට ඇඳුමේ තිබී රු.260.00 මුදලක් හමුවී ඇති බවත්, ඒ පිළිබඳ විමසීමේදී එම මුදල් අමතක වීමකින් රැගෙන ආ බව පවසා ඇති බවත්, පෙර අවස්ථාවේදී නිලධාරිනියන් විමසා සිටීමේදී එම මුදල් ඔවුන් වෙත භාර නොදීම පිළිබඳව දොස් පවරා ඇති බවත්, පසුව සැකකාරියට මෙය වරදක් බව පහදා දී එදින සැකකාරියන් භාර ජේලර්වරයාට මේ බව ලිඛිතව දන්වා එම මුදල් භාර දී ලේඛන ගත කර ඇති බවත් සඳහන් කර ඇත.

පසුව මේ පිළිබඳව 2015.07.15 දිනැතිව ලිඛිතව වාර්තා කර තිබූ බැවින් විමර්ශනයක් සිදුකර ඇති බවත්, ඒ සඳහා සැකකාරියගෙන් ප්‍රකාශයක් ලබාගැනීමට කටයුතු කරමින් සිටියදී එම අය 2015.07.16 දිනම ඇප මත මුදා හැර තිබූ බැවින් ඇයගේ ප්‍රකාශ ලබා ගැනීමට නොහැකි වූ බවත්, එකී විමර්ශනයේදී අදාළ නිලධාරිනියන් දෙදෙනා සැකකාරියට මුදල් සඟවා තබා ගැනීම සම්බන්ධව දෝෂාරෝපණය කර ඇති බව අනාවරණය වී ඇති නමුත් පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇති චෝදනා එනම්, ඇයට පහරදීම, ඇඳුම් පිටින්ම ජලය වත්කර තෙත ඇඳුමින් සිටීමට සැළැස්වීම යන චෝදනා සනාථ වී නොමැති බවත්, එමෙන්ම පැමිණිලිකාරියට එසේ සිදු වුවා නම් පසු දින හෝ ඒ පිළිබඳව සැකකාරියන් භාර ජේලර්වරයාට ඒ බව පැමිණිලි කිරීමට හැකියාව තිබූ බවත්, හා ඒ බව අධිකරණයට දැන්වීමට හැකියාව තිබූ බවත්, එසේ කටයුතු නොකර මේ ආකාරයට පැමිණිල්ලක් ගොනු කර ඇත්තේ, ඉහත සඳහන් නිලධාරිනියන් ඇයහට මුදල් සඟවා තබා ගැනීම සම්බන්ධව දොස් පැවරීම තුළ ඇය යම් නොසතුටකින් සිටි හෙයින් යැයි සිතිය හැකි බවත්, අදාළ නිලධාරිනියන් සැකකාරියට දොස් පැවරීමට අදාළව ඔවුන් විනය ශාලාවට ඉදිරිපත් කර අවවාද කිරීමට කටයුතු කළ බවත්, ඉදිරියට මෙවැනි සිදුවීම් ඇති නොවීමට වග බලා ගන්නා බවත් දන්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය :-**

වගඋත්තරකාර බන්ධනාගාර කාන්තා නියාමකවරියන් කොමිෂන් සභාව වෙත කැඳවා සිද්ධියට අදාළව ප්‍රකාශ ලබා ගෙන ඇත.

ඉහත ප්‍රකාශ තුළ පැමිණිලිකාරියගේ තිසරපටය තුළ තිබු රු.260.00 ක මුදලක් හමුවු බවත්, ඔවුන් විසින් පැමිණිලිකාරියට පහර නොදුන් බවත්, නිරුවත් නොකරන ලද බවත්, කාන්තා රැඳවියක වන සිරියාවති ලවා පැමිණිලිකාරියට ඇඳගැනීමට ඇඳුම් ලබාදුන් බවත්, ඇයව ඇඳුම් පිටින් නැහැවීමට කිසිඳු අවශ්‍යතාවයක් නොතිබු බවත් ඇතුළු කරුණු ප්‍රකාශ කර ඇත.

අනතුරුව 2015.10.09 දින දෙපාර්ශවය කැඳවා විමසීමට ලක් කිරීමේදි, පැමිණිලිකාරිය තමන් මුහුණ දුන් සිද්ධිය විස්තර කර ඇති අතර, වගඋත්තර පාර්ශවය සියළු චෝදනා ප්‍රතික්ෂේප කර ඇත. එහිදි වෛද්‍ය වාර්තාවේ සඳහන් සියළු කරුණු පිළිගැනීමට නොහැකි බවත්, තමන් පැමිණිලිකාරියට පහර නොදුන් බවත්, ඇය අධිකරණයෙන් ඇප මත මුදා හල පසු යම් කිසි අනතුරක් සිදු කර ගත්තා විය හැකි බවත්, ප්‍රකාශ කර ඇත.

පසුව වගඋත්තරකාර බන්ධනාගාර නියාමකවරියන්ගේ ප්‍රකාශ වලින් හා පැමිණිල්ලෙන් හෙලිදරව් වන එවකට බන්ධනාගාර රැඳවියක වු හෙට්ටිගේ දෝන සිරියාවති (545711451 v)යන අයගෙන් ප්‍රකාශ ලබාගෙන ඇත. ඒ අනුව හෙට්ටිගේ දෝන සිරියාවති විසින්, කාන්ති මල්ලිකා නිලවිර නැමැති සැකකාරිය බන්ධනාගාරය තුළ රැඳවිමේදි, බන්ධනාගාර නිලධාරිනියන්ගේ උපදෙස් මත පරික්ෂාවට ලක් කළ බවත්, කාන්ති මල්ලිකා රනවීර යන අයගේ තිසරපට බුරුල්කර සෙලවිමේදි යම් දෙයක් බිමට වැටුණු බවත්, එය අහුලාගෙන බලන විට මුදල් බව තේරුණ බවත්, එම මුදල සඳමාලි නැමැති නිලධාරිනියට භාරදුන් බවත්, එහිදි සඳමාලි නිලධාරිනිය කාන්ති මල්ලිකා නිලවිර යන අයට බැණ වැදුනු බවත් සඳහන් කර ඇත. අනතුරුව සැකකාරිය වන කාන්ති නිලවීර යන අයට ඇඟ සෝදාගැනීමට වතුර ටැංකිය ලඟට කැඳවාගෙන ගිය අතර, එහිදි ඇයව නිරුවත් කිරිමක් සිදුනොකළ බවත්, ඇඳුම් පිටින්ම ඇයව නැව්වේ නැති බවත්, හා එහි නිර්වස්ත්‍රව ඇවිද්දෙව්වේ නැති බවත්, හා ඇය පිස්සු අසනීපයක් තිබෙන බව හා ඇයගේ ඔළුව රිදෙන බවත් දැන්වු බවත් ප්‍රකාශ කර ඇත.

පැමිණිල්ලේ සඳහන් පරිදි බන්ධනාගාර නිලධාරින්ගේ ශාරීරික හා මානසික හිංසනයන්ට ලක්වීමෙන් අනතුරුව, පැමිණිලිකාරිය බණ්ඩාරවෙල මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඇප ලබා 2015.07.16 දින බදුල්ල මහ රෝහල වෙත ප්‍රතිකාර සඳහා ඇතුළත් වු බවත්, එහිදි දින 07 ක් ප්‍රතිකාර ලබා ගත් බවත් සඳහන් කර ඇති බැවින්, ඊට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත කැඳවා ඇත. එම අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව, රෝගියා විසින් දෙන කෙටි රෝග ඉතිහාසය තුළ “මම ගමේ (මීරගහවත්ත) ගල් වලක් පවත්වා ගෙන යනවා එහි වැඩ කරන සේවකයින්ගේ EPF,ETF සම්බන්ධව නඩුවක් වැලිමඩ උසාවියේ තියෙනවා. ඒ සම්බන්ධයෙන්

2015.07.15 දින එක දිනකට (2015.07.15) මාව රිමාන්ඩ් කරා. එදින සවස 02.00ට මාව බන්ධනාගාර බස් එකෙන් බදුල්ලට ගේන්න නැග්ගුවා. ඒ එන අතර එහි සිටි කාන්තා නිලධාරිනියන් කුණුහරුපයෙන් බැන්නා. හවස 5.45ට පමණ මාව බදුල්ල බන්ධනාගාරය ඇතුළට දැම්මා. ඒ අවස්ථාවේදිත් කැත වචනයෙන් බැන්නා. ඊට පස්සේ අතින් මුහුණට ගැහුවා ඒ සමඟම තවත් නිලධාරිනියක් ආවා. ඇයත් අතින් පයින් ගැහුවා. ඇඳුම් ගලවන්න බල කලා. පස්සේ මාව නිරුවත් කලා. ඊට පස්සේ වතුර බකට් වලින් ගැහුවා. සවස 06.00 පමණ වන විට පරණ ඇඳුමක් ඇඳ ගන්න දුන්නා." යනුවෙන් සඳහන් වේ.

තවද වෛද්‍ය වාර්තාවට අනුව, පැමිණිලිකාරියගේ නාසය මත තැලීමක් හා දකුණු ඇසේ කළු ඉංගිරියාවට යට පැත්තේ ලේ පිරීමක් ඇති බවත්, වම් කකුලේ මැද කොටසේ තැලීමක් හා එහි උඩ කොටසේ හමේ සීරීමක් (Graze) දක්නට ඇති බවට හා ඒවා පැමිණිලිකාරිය විසින් ලබා දුන් ඉතිහාසය හා ගැලපෙන බවට අධිකරණ වෛද්‍යවරයා විසින් සටහන් කර ඇත.

එසේම මනෝ වෛද්‍ය විශේෂඥවරයා විසින් ඇගේ කඳුළු සලන බව, ඇඩීම සහ බිය සහිත බව ඇය මුහුණ දුන් ඉහත සිද්ධියට හේතුවන බව සඳහන් කරමින් මානසික උපදේශනකයට යොමු කළ යුතු බවත්, සඳහන් කර ඇත. එම උපදේශනයට අනුව අධිකරණ වෛද්‍යවරයා විසින් ඉහත සිද්ධිය හේතු කොට ගෙන ඇයට මානසික රෝගයක් තිබෙන බවත්, ඒ අවස්ථාව වන විටත් ඇය මානසික රෝග සායනයෙන් ප්‍රතිකාර ලබන බවටත් ඔහුගේ මතය ප්‍රකාශ කර ඇත. ඒ අනුව චූදිත බන්ධනාගාර නිලධාරිනියන් දෙපළ පැමිණිලිකාරියව කායික හා මානසික හිංසනයකට ලක් කර ඇති බව නිරීක්ෂණය වේ.

මෙහිදී ඉදිරිපත් වූ සියළු තොරතුරු සැළකිල්ලට ගැනීමේදී, බන්ධනාගාර නියාමකවරියන් දෙදෙනා වන පී.වී.එස්.ආර්.පට්ටිවිදාන හා ඩී.එස්.ජයලත් යන නිලධාරිනියන් විසින් කාන්ති නිලවීර යන පැමිණිලිකාරියට බන්ධනාගාරය තුළදී බැණ වැදී ඇති බව අභ්‍යන්තර පරීක්ෂණයේදී තහවුරු වී ඇති බැවින් ඔවුන් දෙදෙනා විනය ශාලාවට කැඳවා අවවාද කළ බව බදුල්ල සහකාර බන්ධනාගාර අධිකාරී විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වාර්තාව මඟින් නිරීක්ෂණය වේ. එසේම මෙහිදී පැවති විමසීමේදී පළමු වගඋත්තරකාර පී.වී.එස්.ආර්.පට්ටිවිදාන යන අය ආවේගශීලී වූ බැවින්ද ඇයගේ රාජකාරි ස්ථානයේදී මෙම පැමිණිලිකාර කාන්ති නිලවීර යන අය තමන්ට මෙම බන්ධනාගාර නිලධාරිනියන් පහර දුන් බවට හා අමානුෂික ලෙස සැලකූ බවට කරනු ලබන චෝදනා සනාථ වීමට වැඩ බර ශක්‍යතාවයක් පවතින බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

මේ අනුව ඉහත සියළු කරුණු සලකා බැලීමේදී පැමිණිලිකාරිය විසින් කර ඇති චෝදනා සනාථ වන බැවින්, චූදිත නිලධාරිනියන් දෙපළ විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බැවින් වගඋත්තර පාර්ශවය සම්බන්ධව විනය පියවර ගත යුතු බවට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත මෙයින් දන්වා සිටිමි.

2023.02.24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

02. අමාත්‍යතුමා,
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරු පුනරුත්ථාපන අමාත්‍යාංශය,
නො 40, බුත්ගමුව පාර, රාජගිරිය.

03. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
බදුල්ල.

B/